29 වන පිටෙන්

සැරයක් නොමිලේ ටිකට් පත් කීපයක් ලැබෙනවා. එක සැරයක් 'අංගුලිමාල. චිත්‍රපටය බැල්කනියේ බැලූවා මතකයි. මේකෙ දර්ශනයක් තියෙනවා නළුවකු කණුවේ ගැටහලා අතපය බැඳලා ගහන දර්ශනයක්. මේක අපට මහා විශ්මිතයක්. අයියත් පුදුමයෙන් බලා හිටියා. ඊට පහුවෙනිදා නිවාඩු දවසක්.

අම්මා රෙදි සෝදන්න ළිඳ ළඟට ගිය වෙලාවක අයියා මගෙන් ඇහුවා ඒ දර්ශනය කරමුද කියලා. මං හා කීවා. දැන් ගෙදර කණුවක මාව රෙදි පටිවලින් ගැටගහලා කසයක් වගේ එකක් හදන් අයියා මට තළනවා. හරිම වේදනාවයි. මගේ විලාපයට යටිගිරියෙන් කෑ ගැහිල්ලට අම්මා ගෙට දුවගෙන එනකම්, අයියා මට ගැහුවා.

තවත් දවසක් තාත්තා අපූරු වැඩක් කළා. තාත්තා මටයි අයියාටයි සරම් අන්දලා ඔළුවෙ සුම්බර බැඳලා ගමන් තාලයක් දාලා ගීතයකට නැටුමක් ඉගැන්නුවා. ගීතය ගයන්නේ ජෝතිපාලයි මිල්ටන් පෙරේරායි. ගීතය තමයි ''රයිගමයාණෙනි, ගම්පළයාණෙනි, කම්මැළිකම ගව්වක් පරදා යන්න. මේකට අපි දෙන්නා පුහුණු කරලා අපට උපදෙස් ටිකක් දුන්නා ඒ විදියට කරන්න.

තාත්තා යාළුවෙක් දෙන්නෙක් එක්ක ඉඳහිට ගෙදර පොඩි පාටියක් දානවා. මධුවිත ටිකක් තොල ගානවා. එදා හිටියෙ තාත්තගෙ ඉංජිනේරු මහත්මයෙක් හා හන්දියෙ කඩයක් තිබුණ සිරිල් මාමා. මේ දෙන්නත් එක්ක ටිකක් අර පානය අරගෙන මෙන්න එකපාරටම මෙයා කියනවා. කෝ සින්දුවක් වත් නෑනෙ. කොල්ලො මෙහෙ වරෙන්.

මෙන්න! මේ මාමාලාට පේන්න මොනවා හරි සින්දුවක් කියල නටාපන් කියලා. අපි ඉතින් කලින් ලැබුණු උපදෙස් අනුව ක්‍රියාකරන්නෙ. අපි සරම් හා සුම්බර ඇඳගත්තා. ගමන් තාලය ඇල්ලූවා. දෙන්නා ජෝති හා මිල්ටන් වෙලා රයිගමයාණනි, ගම්පළයාණෙනි ගීතය කටින් කිය කියා නැටුවා. ඉංජිනේරු මහත්මයාටයි සිරිල් මාමටයි පුදුමයි. තාත්තාත් පුදුම වෙලා රඟපානවා. මේ වගේ හිරිමල් කොල්ලො දෙන්නෙක් මෙහෙම කරනවා මාත් කවදාකවත් දැකලා නෑ. කොහෙන්ද? බං මේ නැටුම් ඉගෙන ගත්තෙ. එහෙම කියලා එයත් රඟපානවා. අර මාමලාට සතුටුයි.

දවස් දෙකක් ගියේ නෑ. සුදු පාට ටේප් රෙකෝඩරයකුයි ස්ටූල් එකකුයි අරන් මෙන්න සිරිල් මාමා අපේ ගෙදර ආවා. ඇවිත් කීවා අර සින්දුව ආයිත් කියන්න කියලා. අපි දෙන්න ඊටත් වඩා හොඳින් එදත් ගායනා කරමින් නැටුවා. පස්සෙ එයා ඒක දාලා පෙන්නුවා. තාත්තාටයි අපටයි. අපේ කටහඬ නැවත මුල් වරට ඇහුවෙ එදා. ඊට පස්සෙ සිරිල් මාමා අප පාසල් ඇරිලා මාමලාගේ රොකෝඩ් බාර් එක ළඟින් එනකොට ඈත තියාම අර සින්දුව ලවුඩ්ස් පීකර්වලින් දානවා. මුළු බණ්ඩාරවෙල ටවුමම මේ ගැන පසුව දැනගත්තා.

අපේ තාත්තයි අම්මයි උග්‍ර කතෝලික අය වුණාට තාත්තා තමයි මට මුලින්ම පන්සල් ඇසුර දුන්නෙ. පාන්දර පහට නැගිටලා පල්ලියේ පූජා, ගීතිකා ආදියට යනවා වගේම එයා දෝණ රජමහා විහාරයේ පොඩි හාමුදුරුවන්ට මා භාරදුන්නා නිවාඩු දිනවලට 'ධම්මපදය. උගන්වන්න කියලා. තාත්තාට මගේ අනාගතය ගැන පැහැදිලි ඉවක් තිබුණ කියල මට තේරෙන්නෙ දැනුයි. පොසොන් එකට ඒ ළඟ හිටපු චිත්‍ර ශිල්පියකුට කියලා මහින්දාගමනයට අදාළ පින්තූර අන්දලා එයා 'මිහින්තලේ. අපට කියලා හදවනවා. තාත්තාගේ බයිසිකලේ පදිනකොට ඩයිනමෝ එකේ බලයෙන් තමයි 'මිහින්තලේ. ආලෝකවත් වන්නේ.

තාත්තා පළාතේ විකට ඇඳුම් තරගවලටත් මා ගෙනියනවා. සායක් අන්දලා මුහුණේ කළු පාට ලාටු වගේ දේ ගාලා 'පිස්සු මහත්තයා. කියලා 'පාටි. එකක් තමයි එතුමා කරවන්නේ. හැමදාම පළමුවැනියා.

මේ අතර එක්තරා පත්තර පිටුවක තිබුණා පිටුව පුරා දැන්වීමක්. ලස්සන තරුණියක් එක් අතකින් ඹ ගහපු යුනික් වර්ගයේ රේඩියෝවක් හා අනෙක් අතින් ඇඹුල අරන් යන දර්ශනයක්. මේක දැකලා මං තාත්තට ඒ ගැන කීවා. තාත්තා කොහොම හරි මේක ගෙදර ගෙනාවා.
උපාලි ගෲප් එකේ ඹ අකුර ගහපු 'යුනික්.


ජැක්සන් විවාහ වූ දා මව හා පියා සමඟ

රේඩියෝව අපට මැජික් එකක්. ඒකෙ ළමා පිටියට මම චිත්‍ර ඇන්දා. සුමනා ජයතිලක නැන්දයි, ලැම්බට් පෙම්මාවඩු මාමයි. මේ වැඩසටහන කළේ. ඒකෙ කතන්දරයක් තියෙනවා ඒකට කැමති විදියේ දර්ශනයක් චිත්‍රයට නඟලා ගුවන් විදුලියට යවන්න ඕනෑ. තාත්තා 'අවශ්‍ය බඩුමුට්ටු ටික දීලා කියනවා. ඒකට චිත්‍රය අඳින්න. මම වන්නම් කියලා. මාත් ළමා පිටිය අහලා චිත්‍ර 25 . 30 ක් ඇරියා. කවදාවත් අවස්ථාවක් නෑ. තාත්තා මාව දිගටම පෙළඹෙව්වා. මාත් චිත්‍ර අඳිනවා. මෙන්න එක වතාවක් කියනවා අද ජයග්‍රාහකයා බණ්ඩාරවෙල ජැක්සන් ඇන්තනී කියලා. මං තාත්තා එනකම් නොඉවසිල්ලෙන් බලා ඉන්නවා. තාත්තා ගෙට ගොඩවෙච්චි ගමන් මේ පණිවුඩය කීවා.

ආ, මරුනේ. පුතේ මං කීවෙ කවදාක හරි අපි දිනනවා කියලා. එයා ඒ විදියට හරියට අපිව අගය කරනවා. හැබැයි තෑග්ග ගන්න ගුවන් විදුලියට යන්න ඕනෑ. එතකොට ඔය රඟපාන (සුදත් ඇන්තනි දෙවැනි ඉනි- මේ ඩිලාන්* මගේ මල්ලි අම්මගෙ බඩේ. ඒ නිසා අයියවයි . අම්මවයි නතර කරලා තාත්තා මාවත් අරන් නයිට් මේල් දුම්රියෙ කොළඹ එන්න නැග්ගා. තාත්තාගේ ආසනේ ඉදිරිපිට පත්තර කොළ කිහිපයක් දාලා මං නිදාගත්තා. එළිවෙනකම් එනවනෙ. එළිවෙලා කොළඹින් බැස්සා. පාර අයිනෙ ටැප් එකකින් මුහුණ හෝදගෙන ඩබල් ඩෙකර් බසයක නැගලා ගිහින් කොහොම හරි ගුවන් විදුලිය ළඟටත් ආවා. මං හිතන්නෙ දැන් මාව පිළිගන්න මල්මාලා අරගෙන කට්ටිය හිඳී කියලයි. බලනකොට කවුරුත් නෑ. කවුන්ටරය ළඟට ගිහින් ඇහුවාම ටිකක් වාඩිවෙලා ඉන්න කීවා. තෑග්ග මොකක්ද දන්නවාද? මිල්ක්රේ චොකලට් එකක්. ඒක බණ්ඩාරවෙල කඬේකින් ගන්න තිබුණා. වෙහෙස මහන්සිය වියදම මේවා ගැන කල්පනා වුණා. ඒත් තාත්තා කීවා ''පුතේ මේ චොකලට් එක සල්ලි දීලා ගත්තෙ නෑ. මේක ඔයාගෙ දක්ෂතාවට අගය කිරීමට ලැබුණු දෙයක්. ඒ නිසා ඒක ගොඩාක් වටිනවා'' කියලා. ඒ චොකලට් පෙත්ත පෙත්ත පවුලෙ කට්ටිය හැමෝම ආශාවෙන් කන්න හිතුණේ ඒ වචනවලටයි.

මේ අතරෙදි තාත්තාට ආයිත් මාරුවක් එනවා කොළඹට. අපි සියලූ දෙනා අම්මා හදපු පොඩි වීකුඹුරෙ ඒ ගෙදරට එනවා. අයියව තාත්තා දැම්මේ දි මැසනොද් කොලීජියට කඳානේ. මාව මුලින් දැම්මේ හපුගොඩ ඉස්කෝලෙට. ඒකෙ ප්‍රධාන ශාලා 2 යි. පොඩි ඉස්කෝලයක්. ඒත් මගේ හිත ප්‍රියයි ඒ ඉස්කෝලෙට. මම ඒකෙ කැපී පෙනෙන ශිෂ්‍යයෙක් වුණා. නාට්‍ය පැත්තෙන් ලොකු වැඩ කොටසක් කළා. යුනික් රේඩියෝවෙන් 'ගුවන් විදුලි රඟමඬල. (සුගතපාල ද සිල්වා කළ) අහලා ඒ ඇසුරින් මා නාට්‍ය ලියනවා. ඒවා ජනප්‍රිය වෙනවා. පල්ලියෙ ගීතිකා කියන්න මාත් යනවා. මර්සලීන් ජයකොඩි පියතුමාගේ වැඩ පිළිවෙළ මගේ හිතට අල්ලනවා. ඒ අනුව මං පල්ලියේදී පාවහන් ගලවන්නත් ජේසුට මල් පූජා කරන්නත් යනවා. ප්‍රින්සිපල් වින්සන්ට් මෙන්ඩිස් මහත්මයා මං හැමදේම කරන හින්දා මට කැමැතියි. එයා තාත්තගෙත් හොඳම හිතවතෙක්. තාත්තා අහනවා මාවත් අයියලගෙ මැසනොද් කොලීජියට දාන්නද කියලා. ඒ කොලීජිය හරි දැවැන්තයි. මං කීවෙ අමුතු කතාවක්. ''තාත්තෙ ලොකු ඉස්කෝලෙකට ගිහින් ඒ අය අතර පොඩි මිනිහෙක් වෙනවාට වැඩිය මං කැමැතියි පොඩි ඉස්කෝලෙකට ගිහින් ලොකු මිනිහෙක් වෙන්න'' කියලා. තාත්තත් මගේ කතාවට එකඟ වුණා.

අපේ ගම් පළාතෙ හරියට ආධුනික ගී තරග තියෙනවා. තාත්තා තමයි ඇවිත් කියන්නේ තිබෙන ස්ථානය.

බෙලිගහමුල සෙනසුරාදා ගී තරගෙ ලෑස්ති වෙයන් කියලා. මාත් ගිහින් කියනවා. කියන්නෙ පියාණනී මා නැවත උපන්නොත්...ගීතය. මං දිනනවා. ප්ලේස් එකක් ලැබෙනවා. එක දවසක් ගමට කිට්ටු තැනක හතරමං හන්දියේ ගී තරගෙ. තාත්තා මගෙන් ඇහුවා පුතේ මොකද්ද? අද කියන්නෙ කියලා. මම කිව්වා පියාණනි මා නැවත උපන්නොත් ගීතය කියලා. එපා පුතේ උඹ මව් ගුණ ගී දන්නෙ නැද්ද? කියලා ඒ වතාවෙ එයා ඇහුවා. මම කිව්වා දන්නවා කියන්නම් කියලා. 'ආදරයේ උල්පත වූ අම්මා. ගීතය. මම ඇහුවා ඇයි! තාත්තෙ' ඒ ගීතය කියන්නයි කියන්නෙ කියලා. ඒ වතාවෙ තාත්තා කියනවා නෑ පුතේ අම්මා එනවා බලන්න කියලා. බලන්න! කොච්චර අහිංසක විදියට හිතන කෙනෙක්ද? මම එදා කීවෙ ඒ ගීතයයි. එයා මං නාට්‍ය ක්ෂේත්‍රයේ, සිනමාවේ, ටෙලිනාට්‍යයේ නැඟී එද්දී ආශාවෙන් බලා හිටියා. මා රඟපාන නාට්‍ය බලන්න රට පුරා ශාලාවලට එනවා. එයා කළුවරේ ඉඳන් කැස්සහම (එයාට පොඩි කැස්සක් තිබුණා) ම දන්නවා තාත්තා ශාලාවේ
ඉන්නා බව. ඒ තරම් එතුමා මට කිට්ටුයි.

අපේ පවුලේ කොල්ලො පස් දෙනෙක්. ඒත් ගමේ අය කීවෙ කොල්ලො 6 දෙනාගෙ ගෙදර කියලයි. තාත්තත් එක කොල්ලෙක් හැටියට ගැමියන් ගණන් බලා තිබුණේ. ඒ තරම් ක්‍රියාශීලියි අපේ ඉඩමේ පිටුපසින් පසු කාලයක ගෙවල් මණ්ඩියක් හැදුවා. ඒ අයට යන්න පාරක් තිබුණේ නෑ. දවසක් ෆීලික්ස් පෙරේරා ඇමැතිතුමා ආවා. ඒ ගෙවල් මණ්ඩියට පාරක් ගන්න කතා කරන්න. තාත්තා එකපාරටම කීවෙ 'ගන්න ගන්න. අඩි 20 ක පාරක් එතුමා අපේ ඉඩමෙන් දුන්නා. ඒ මිනිසුන්ටත් පාරක් තියෙන්න ඕනෑනෙ...' එහෙම තමයි තාත්තා කීවෙ. ඒ කළ උපකාරයට ඒ පාර නගර සභාවෙන් නම් කළේ 'බෙනඩික් ඇන්තනි මාවත. නමින්.

'ගිනිඅවි හා ගිනිකෙළි' චිත්‍රපටයේ මා රඟපාන මැරයාගේ චරිතය රෑ තිස්සේ කරලා මං උදේ මහ ගෙදර ගියා. අපේ මහ ගෙදර සෙනඟ පිරිලා. මගේ තාත්තා ගෙදරදීම අන්ත්‍රා වෙලා. උදේ ශරීරකෘත්‍යය සඳහා වැසිකිළියට ගියාම එයා වැටිලා. එයා කවදාවත් ලෙඩ රෝග පෙන්වපු කෙනෙක් නොවෙයි. පොඩි කැස්සකට වුණත් අම්මා කලබල වුණොත් කියනවා 'උඹලගෙ අම්මට පිස්සු මේ බලපන් මගේ ෆිට් එක' කියලා කොලූ පාට් දාන මගේ පරමාදර්ශය එදා නැතිවුණා. ඊට පස්සෙයි අපිට හමුවන්නේ එතුමා රහසින් බෙහෙත් ගත් බව. දිව යට තියෙන පෙති බෝතලයක් එයා නිදාගන්නා කොට්ටය යට තිබිලා පස්සෙ හමුවුණා. මගේ පරමාදර්ශය තාත්තා. තාත්තා මගේ ලෙයට විතරක් නොවෙයි රංගනයටත් කෙළින්ම සම්බන්ධයි.